**මහවැලි ජල ආරක්ෂක ආයෝජන වැඩසටහන - 2017**

**-----------------------------------------------------**

මහවැලි ජල ආරක්ෂක ආයෝජන වැඩසටහනේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2015 සැප්තැම්බර් 17 දින එළඹි අංක 3267 (එස්ආර්අයි) දරන ණය ගිවිසුමේ 4.06 (අ) ව්‍යවස්ථාව සහ අංක 3268 (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 4.03 (අ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**------------------------------------------------------------------------------------**

වැඩසටහනේ ණය ගිවිසුම් අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, වැඩසටහන් ප්‍රදේශය තුළ කෘෂිකාර්මික කටයුතු වලට හා පානීය කටයුතුවලට ඇති ජල සම්පත් සඳහා ප්‍රවේශය ආරක්ෂා කිරීමයි. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 28,713 කට සමාන එජඩො මිලියන 190 ක් වන අතර ඉන් රු.මිලියන 22,668 කට සමාන එජඩො මිලියන 150ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 ජූනි මාසයේදී ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලබන වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහන් වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ(ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාස තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතිය හා මිනිපේ වම් ඉවුර පුනරුත්ථාපන ව්‍යාපෘතියේ සිවිල් වැඩ සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 35.41 ක් වූ ශේෂ ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව, වැඩසටහන් කළමනාකරණ ඒකකයේ කාර්යමණ්ඩලය සඳහා වයස අවුරුදු 65 ට වැඩි පුද්ගලයන් බඳවා නොගත යුතුය. කෙසේ වුවද, වයස අවුරුදු 65 ට වැඩි පුද්ගලයකු ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයකු ලෙස බඳවා ගෙන තිබූ අතර රු.751,200 ක් වූ පාරිශ්‍රමික සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳව වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කරන ලද අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | | | | | | | |
| - ණය අංක 3267 | 76.00 | 11,485.10 | 2,068.48 | 3.70 | 561.60 | 6.60 | 998.80 |
| - ණය අංක 3268 | 74.00 | 11,182.90 | 1,996.32 | 6.40 | 974.40 | 12.50 | 1,833.80 |
| ශ්‍රී ලං ර | 40.00 | 6,044.80 | 786.20 | 2.90 | 436.40 | 5.10 | 752.70 |
| එකතුව | 190.00 | 28,712.80 | 4,851.00 | 13.00 | 1,972.40 | 24.20 | 3,585.30 |

**3.2 භෞතික ප්‍රගතිය**

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව, ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතිය ඉදිකිරීම, වයඹ පළාත් ඇල ව්‍යාපෘතිය ඉදිකිරීම, මිනිපේ වම් ඉවුර ඇල ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම හා උපදේශක සේවා සැපයීම යන ප්‍රධාන සංරචක 04 යටතේ වැඩසටහනේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබූ අතර, එම වැඩවලින් සියයට 14 ක භෞතික ප්‍රගතියක් ඉටුකර ගැනීම සඳහා අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වැඩවල සියයට 08 ක භෞතික ප්‍රගතියක් පමණක් ඉටු කරගෙන තිබුණි. තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කිරීම සඳහා සැලසුම් කර තිබූ ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතිය යටතේ කළු ගඟ, මොරගහ කන්ද මාරු ඇල (transfer canal) ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව, ප්‍රසම්පාදන පරිපාටි යොදාගැනීමේදී ඇති වූ සංකීර්ණත්වය හේතුවෙන් ප්‍රදානය කර නොතිබුණි. එබැවින්, ඒ සඳහා කරන ලද රු.මිලියන 1,819 ක් වූ වෙන්කිරීමෙන් රු.මිලියන 352 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) වයඹ පළාත් ඇල ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම අනුව, 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තු 03 ක් ප්‍රදානය කිරීමට අපේක්ෂා කර තිබූ අතර ඉන් වැමැඩිල්ල වම් ඉවුර ප්‍රධාන ඇල නැබඩගහවත්ත දක්වා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව පමණක් 2016 දෙසැම්බර් 29 දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, අදාළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් වැඩවල භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂය තුළ සියයට 05 ක අඩු මට්ටමක පැවතුණි.

(ඇ) වැමැඩිල්ල පසුපස ඇලෙහි (tail canal) නව සොරොව් ගේට්ටු ඉදිකිරීම් වැඩ, උපදේශක විසින් සැලසුම් සඳහා අනුමැතිය දීම ප්‍රමාද වීම හේතුවෙන් මාස 08 කට වැඩි කාලයක් අත්හිටුවා තිබුණි.

(ඈ) මිනිපේ වම් ඉවුර පුනරුත්ථාපන වැඩ සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව, 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කිරීම සඳහා අපේක්ෂා කර තිබූ සිවිල් වැඩ කොන්ත්‍රාත් 06 කින් සිවිල් වැඩ 04 ක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ඒ පිළිබඳ ඉදිකිරීම් වැඩවල සියයට 25 ක අපේක්ෂිත ප්‍රගතියට වඩා අඩු සියයට 17 ක මන්දගාමී ප්‍රගතියක් වාර්තාකර තිබුණි. ව්‍යාපෘතිය විසින් කරන ලද පැහැදිලි කිරීම අනුව, ගොවීන් විසින් කරන ලද ඉල්ලීම් මත වගා කටයුතු සඳහා ජලය නිකුත් කිරීමට සිදුවීමෙන් පුනරුත්ථාපන වැඩ සඳහා අතරමඟ බාධා සිදු වී තිබුණි.

(ඉ) උපදේශකවරුන් තෝරාගැනීමේදී මතු වූ ගැටලු හේතුවෙන්, පද්ධති කාර්යක්ෂමතාවයන් හා ජල ඵලදායීතාවය වැඩි දියුණු කිරීම පිළිබඳ උපදේශක සේවා සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. එබැවින්, ඒ සඳහා කරන ලද රු.මිලියන 77 ක් වූ වෙන්කිරීම් 2017 දෙසැම්බර් 31 දිනට ඌන උපයෝජිතව පැවතුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---

ගිරිතලේ රක්ෂිත කැලය හරහා මොරගහකන්ද ජලාශය සිට කොන්කැටිය ජලාශය දක්වා කිලෝමීටර් 6.20 ක දිගින් යුත් වාරිමාර්ග ඇලක් ඉදිකිරීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට ස්ථාන 03 ක පමණක් ආරම්භ කර තිබුණි. වෙනත් අරමුදල් මූලායන ව්‍යාපෘතියක් විසින් කොටසක් සම්පූර්ණ කරන ලද ජලාශ වේල්ලෙහි උස ජලය සැපයීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් නොවූ හෙයින් සහ මෙම ව්‍යාපෘතිය යටතේ වේල්ලේ උස මට්ටම වැඩිකිරීම සඳහා අතිරේක වැඩ සිදුකිරීමට අවශ්‍ය වූ හෙයින් මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොන්කැටිය ජලාශයේ ප්‍රතිසංස්කරණ වැඩ සාර්ථක නොවී ඇති බව අනාවරණය විය.

### 3.4 පාරිසරික කරුණු පිළිබඳ ගැටලු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඉහළ ඇලහැර ඇල පිළිබඳ සංවර්ධන වැඩ හේතුවෙන් ඇතිවන පාරිසරික හානි අවම කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 94.80 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද, ඒ පිළිබඳ තොරතුරු කටයුතු සඳහා සංඥා පුවරු 07 ක් පමණක් රු.මිලියන 1.10 ක පිරිවැයකට ස්ථාපිත කර තිබුණි. තවද ඇලහැර ප්‍රදේශයේ අක්කර 500 ක ගස් සිටුවීමට හා වනාන්තර ලෙස නඩත්තු කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කිරීම අවශ්‍ය වුවද 2017 දෙසැම්බර් 31 දිනට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. ඉහළ ඇලහැර ඇල දෙපස කිලෝමීටර් 03 ක ප්‍රදේශයේ දිවෙන ගිරිතලේ රක්ෂිත වන භූමිය හෙළිකර තිබූ බවත්, නිර්දේශිත ගස් සිටුවීමට කොන්ත්‍රාත්කරු විසින් කිසිඳු පියවරක් ගෙන නොතිබූ බවත් 2018 අප්‍රේල් 03 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) කිලෝමීටර් 30.14 ක් දක්වා මිනිපේ වම් ඉවුර ඇලෙහි පුනරුත්ථාපන වැඩ හේතුවෙන් සිදුවන පාරිසරික හානි අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත් ගිවිසුමේ රු.මිලියන 12.40 ක මුදලක් වෙන් කර තිබූ අතර ඒ පිළිබඳව කොන්ත්‍රාත්කරු කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධානවල අවශ්‍ය පරිදි 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ප්‍රදේශයේ අක්කර 145 ක ගස් සිටුවීමටද කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කර නොතිබුණි.

## 3.5 ඌන උපයෝජිත වත්කම්

පොල්පිතිගම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලිවල වැඩිදියුණු කිරීම් වැඩ ව්‍යාපෘතිය විසින් සිදු කර තිබූ අතර සවිකිරීම් හා එකලස් කිරීම් ප්‍රසම්පාදනය කිරීම සහ වෙනත් අලුත්වැඩියා කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 9.8 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද, 2018 මැයි 10 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අදාළ ගොඩනැගිල්ල ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් භාවිතා කිරීමකින් තොරව පවතින බව අනාවරණය විය.

## 3.6 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන විසින් දරන ලද රු.මිලියන 1,535.57 ක් වූ වියදම එදිනට මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු වාර්තාවල දැක්වෙන රු.මිලියන 1,506.22 ක් වූ වැඩසටහනේ පිරිවැය සමඟ එකඟ වී නොතිබුණි. රු.මිලියන 48.74 ක් වූ ණය පොලී ප්‍රාග්ධනිත කිරීම පිළිබඳ මහා භාණ්ඩාගාරයේ වාර්තාවල සිදුකරන ලද සටහන් කිරීම් හා වැඩසටහන් නියාමන ඒකකය විසින් දරන ලද රු.මිලියන 78.09 ක් වූ වියදමේ ශුද්ධ ශේෂය වාර්තා කිරීම සඳහා සිදුකරන ලද ගැලපීම් ඉහත වෙනස සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව අනුව, වැඩසටහනේ කාර්ය මණ්ඩලය 185 ක සේවක සංඛ්‍යාවකින් සමන්විත වූ අතර, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරු දෙදෙනෙකු, ව්‍යාපෘති ඉංජිනේරුවරුන් 14 දෙනෙකු හා ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරීන් 10 දෙනෙකු යන ප්‍රධාන තනතුරු ඇතුළත් නිලධාරීන් 85 දෙනෙකු වර්ෂ 02 කට වැඩි කාලයක සිට පුරප්පාඩු වී පැවතුණි.